කොටගල ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කොටගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 09 සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉදිකිරීම් ව්‍යාපෘති 3 කට අදාළව රු.1,812,473 කින් ප්‍රාග්ධන වැය හා කර්මාන්ත ණය හිමියන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුමේ ජ්නල් සටහනකින් නිවැරදි කරමි. |
| (ii) | මවුන්ට් වර්නන් වත්ත නිවාස සංකීර්ණයේ පස් ඉවත්කිරීම ව්‍යාපෘතියේ ණයගැති වටිනාකම රු.99,360 ක් වුවද, රු.199,773 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුමේ ජ්නල් සටහනකින් නිවැරදි කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන රීති) 218 | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි. | රීතී ප්‍රකාරව සමීක්ෂණයක් කළ යුතු වේ. | ඉදිරියේදී එම සමීක්ෂණය සිදු කරමී. |
| (ආ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව 2008 වර්ෂයට පසුව සිදුකර නොතිබුණි. | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව කළ යුතු වේ. | ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරමී. |

1.4.1 බදු අවශතාවයන්ට අනුකූල නොවීම.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත අනුව සමාලෝචිත වර්ෂය තුළ අය කරන ලද රු.10,045 ක මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | අදාළ බදු පනත අනුව කටයුතු කළ යුතු වේ . | නව ප්‍රාදේශීය සභාවක් වන මෙහි මුද්දර ගාස්තු බදු හා ජාතිය ගොඩනැගිනීමේ බදු ලියාපදිංචි කිරීමට ඉල්ලීම් කර ඇත. |
| | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව සභාව විසින් අයකළ ජාතිය ගොඩනැගීමේ බදු රු.24,699 දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | අදාළ බදු පනත අනුව කටයුතු කළ යුතු වේ . | නව ප්‍රාදේශීය සභාවක් වන මෙහි මුද්දර ගාස්තු බදු හා ජාතිය ගොඩනැගිනීමේ බදු ලියාපදිංචි කිරීමට ඉල්ලීම් කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 09 සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.566,329 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

2018 අප්‍රේල් 01 දින ස්ථාපිත කර තිබූ සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවයක කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,911,946 | 1,229,892 | 691,013 | 2,172,510 |
| කුලී | 410,000 | 1,131,225 | 973,149 | 538,664 |
| බලපත්‍ර ගාස්තු | 2,228,000 | 650,800 | 656,800 | - |
| වෙනත් ආදායම් | 889,961 | - | 181,073 | - |
| | 6,439,907 | 3,011,917 | 2,502,035 | 2,711,174 |

### 2.2.1 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කඩ කුලී<br>කඩ හිමියන් 15 කගෙන් වසරකට වඩා කාලයක් අය නොවී පවතින රු.186,194 ක හිඟ ශේෂයක් 2019 මාර්තු 15 දින වන විටද අය නොකර පැවතුනි. | හිඟ මුදල් වාහාම අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට රු.302,762 ක මුදලක් අයකර ඇත. කඩ කාමර 02 ක් මුද්‍රා තබා ඇත. |
| (ආ) ගෙවල් කුලී<br>පුද්ගලයන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.13,251 ක ගෙවල් කුලී වසරකට වැඩි කාලයක් අය නොවී පැවතුනි | මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නව ආදායම් පරීක්ෂකවරයා විසින් අදාළ ප්‍රදේශ හදුනාගනිමින් පවතී. |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.649,124 ක උසාවි දඩ හා රු.683,900 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | අදාළ මුදල් සභාව වෙත ලබාගැනීමට කටයුතු කළ කළ යුතු වේ. | උසාවි දඩ උපලේඛන ලැබී නැති අතර මුද්දර ගාස්තුවලින් රු 382,500 ලැබී ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1. කාර්ය සාධනය
-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු කාරණාවක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කර ඇත |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | 2019 දී සකස් කර ඇත. |

(ඇ) අතහැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 මැයි 11 දින රු. 83,373,432 ක වියදමින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට රු.21,559,211 ක් ගෙවා තිබුණි. පරිපාලන හා තාක්ෂණික ගැටළු හේතුවෙන් එහි වැඩ වසර 02 කට අධික කාලයක සිට නතර කර දමා තිබුණි | ගැටළු නිරාකරණය කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තු නිළධාරීන් පැමිණ පරීක්ෂා කර ඇත. |

(ඈ) පාරිසරික ගැටළු

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නුවරඑළිය හා ආගරපතන ප්‍රාදේශීය සභාවල වෙන් නොකරන ලද කසළ සභාවේ කොම්පෝස්ට් අංගනයට බැහැර කර තිබු අතර පරීක්ෂාකරන ලද අවස්ථාවේ එකතුවන පොලිතින් පුළුස්සා දමමින් පැවතුණි. | විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළයුතු වේ. | දැනට කසළ වර්ග කර ලබා ගන්නා අතර පොළිතීන් හා ප්ලාස්ටක් බෝතල් නුවරඑළිය මහා නගර සභාවට ලබා දීමට කටයුතු ඇත. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන හා ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී කටයුතු කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය
---------------------------------

(අ) සේවක පුරප්පාඩු
--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරු 14 ක පුරප්පාඩු 51 ක් පැවතුණි. | හැකි ඉක්මනින් පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. |

(ආ) සේවක ඇප
-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මු.රෙ.880 හා 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑස්/06/06/02 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ ප්‍රකාරව අදාළ නිළධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජල සේවා සැපයීම<br>---------------------<br>සභාව විසින් ජලය සපයනු ලබන ජල සේවා තුනකට අදාලව වියළි කාල වලදී ජලය බෙදාහැරීම ඉතා දුර්වල තත්ත්වයක පැවතීම නිසා මහජන විරෝධතා හා පැමිණිලි ලැබුණත් වර්ෂය පුරාම බිල් කිරීම් සිදුකර තිබුණද, ගාස්තු ගෙවීම පාරිභෝගිකයින් ප්‍රතික්ෂේප කිරීම නිසා 2018.12.31 දිනට රු.550,716 ක හිඟ ශේෂයක් විය. | විධිමත්ව වර්ෂය පුරාම ජල සේවා සැපයීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව වර්ල්ඩ් විෂන් ආයතනය හා ජල සම්පාදන මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඇත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1. අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 අනුව පිලියෙල කල යුතු අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදු වී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2018 දෙසැම්බර් සභා රැස්වීමේදී මාරු පත්‍ර මඟින් නිවැරදි කර ඇත. |

4.2. අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කිරිමට කටයුතු කළ යුතු වේ. | නිළධාරීන්ගේ පුරප්පාඩු පැවති නිසා අභ්‍යන්තර විගණනය සිදු කළ නොහැකි අතර ඉදිරියේදී මෙම විෂය සඳහා නිළධාරීයෙකු යෙදවීමට කටයුතු කරමි. |